විශ්‍රාම වැටුප් චක්‍රලේඛ: 06/2022 (සංශෝධන I)

මගේ අංකය : විවැ/චක්‍රලේඛ/2022
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත,
කොළඹ 10.
2023.06.09

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 අනුව විදේශ රැකියා සඳහා විදේශගත වන නිලධාරීන්ගේ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අය කිරීමට උපදෙස්**

2022.09.20 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 06/2022 වෙත ඔබගේ අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා 14/2022(II) අනුව විදේශගතවී ඇති නිලධාරීන් හා දේශීය නිවාඩු ලබාගත් නිලධාරීන්ගේ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් ගෙවීමේ දී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 06/2022 මඟින් දක්වා ඇත. නමුත් මේ දක්වා වැටුප් රහිත නිවාඩු ලබාගත් නිලධාරීන්ගෙන් වැඩි පිරිසක් නිවැරදි ලෙස මෙම ක්‍රියාපටිපාටිය අනුගමනය කර නොමැති බව නිරීක්ෂණය වේ.

03. නිවැරදි ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ පද්ධතියෙහි ලියාපදිංචි නොවී මුදල් ප්‍රේෂණය කිරීම හේතුවෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ නමින් මහජන බැංකුවේ මූලස්ථාන ශාඛාවේ ගිණුම් අංක 204100119026661 දරන ගිණුමට බැර වී ඇති මුදලින් හඳුනා ගත නොහැකි ශේෂයක් පවතී.

04. එම හේතුවෙන් නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ගේ ශේෂයන් සහ වැටුප් තලයන් තහවුරු කළ නොහැකි වේ. එමඟින් ඇතිවන පරිපාලනමය හා ආයතනමය ගැටළු හා දුෂ්කරතාවන් අදාළ ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් විසින් විසඳා ගත යුතුය. හඳුන්වා දී තිබෙන විධිමත් ක්‍රියාවලිය උල්ලංඝනය කිරීමේ වගකීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට භාර ගත නොහැකිය.

05. ඉහත තත්ත්වය වළක්වා ගැනීමට ඔබ අමාත්‍යාංශය යටතේ ඉහත චක්‍රලේඛ ප්‍රකාරව නිවාඩු ලබාගත් නිලධාරීන් පිළිබඳ විස්තර ඇමුණුම 01 හි දක්වා ඇති ආකෘතියට අනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත wopcontribution@pensions.gov.lk විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ 2023.06.30 දිනට පෙර යොමු කරන ලෙස කාරුණිකව ඉල්ලමි.

06. මේ සම්බන්ධව ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

**ඒ. ජගත් ඩී. ඩයස්**

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත :**

| | |
|---|---|
| 01. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | කරු.දැ.ගැ.ස. |

ඇමුණුම 01

| S/N | Name | NIC | Designation | Ministry / Department | Leave Type (Foreign / Local) | Leave Starting Date | Contact Number | E-Mail Address | Contributors Bank Details |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |